(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 52.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 පෙබරවාරි මස 23 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

55/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික පාසල් දරුවන් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ගොදුරු බවට පත්වී ඇති බවත්;

(ii) පාසල් දරුවන් යොදාගෙන මෙම ජාවාරම් සිදුකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මත්ද්‍රව්‍ය පාසල් තුළට පිවිසීම නැවැත්වීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර පහ තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත් පාසල් ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් නැවත සමාජගත කිරීම සඳහා රජය අනුගමනය කරන ක්‍රියාදාමය කවරේද;

(iii) එසේ සමාජගත කළ දරුවන් පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රියාවලියට සම්බන්ධ පියවරයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

197/'15

2.

ගරු විජිත හේරත් මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2003 වසරේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කිරීමේදී එහි සේවය කළ 3100ක් වූ සේවක සංඛ්‍යාවෙන් 1500ක පමණ පිරිසකට රැකියා අහිමි වූ බවත්;

(ii) යම් ආයතනයක් පර්ක් ආයතනය හරහා විකිණීමේදී සේවකයින්හට හිමිවිය යුතු 10% ප්‍රතිලාභයද ඔවුන්ට අහිමි වූ බවත්;

(iii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් අනුව පසුගිය පාලන සමයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නැවත රජයට පවරා ගැනීමක් සිදු වුවද, සේවය අහිමි වූ සේවකයන් සෑම දෙනාම නැවත සේවයේ පිහිටුවීමක් සිදු නොවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නැවත රැකියාව නොලැබීමෙන් අසාධාරණයට ලක්වූ සේවකයින්ට විසඳුමක් ලබාදීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

199/'15

3\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 අප්‍රේල් 5 දින සිට 11 දින දක්වා කොලොම්බියාවේ පැවති ලෝක නාගරික සමුළුවට (WUF) සහභාගි වූ ශ්‍රී ලංකා (රජයේ) නියෝජිත කණ්ඩායමේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) ඒ වනවිට ඔවුන් දැරූ රජයේ තනතුරු කවරේද;

(iii) එම නියෝජිත කණ්ඩායම තෝරා ගැනීමේ පදනම කවරේද;

(iv) එම සංචාරය සඳහා වියදම් කළ මුදල කොපමණද;

(v) එක් එක් අය වෙනුවෙන් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරය සඳහා පාසල් ශිෂ්‍යයෙක් සහභාගී වූයේද;

(ii) එසේ නම්, ඔහුගේ නම, පාසල සහ ඔහුගේ එවකට වයස කවරේද;

(iii) ඔහුට පමණක් එම අවස්ථාව ලබාදීමේ විශේෂත්වය කවරේද;

(iv) උක්ත සංචාරය සඳහා එම ශිෂ්‍යයා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතිය ලබාගත්තේ නම්, එම ලිපිය සභාගත කරන්නේද;

(v) මෙම සංචාරය සඳහා විදේශ අමාත්‍යාංශයේ අනුමතිය ලබාගත්තේ නම්, එම ලිපිය සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් , ඒ මන්ද?

209/'15

4\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නැගෙනහිර පළාතේ, ඔලුවිල් වරාය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදී රජයට පවරා ගන්නා ලද ඉඩම් වෙනුවෙන් මේ වනවිට වන්දි මුදල් ප්‍රදානය කර ඇති එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය සහ වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ සඳහා පවරා ගන්නා ලද පුද්ගලයින් 48 දෙනෙකුට අයත්ව තිබූ අක්කර 49.5ක ඉඩමෙහි, ඉඩම් හිමියන් අතරින් මෙතෙක් වන්දි මුදල් ලබාදී නොමැති පුද්ගලයින් සඳහා ඉඩමේ වර්තමාන තක්සේරු වටිනාකම අනුව වන්දි ප්‍රදානය කිරීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

232/'15

5.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් කොළඹ 02, මෝගන් පාරේ, කිව් පොයින්ට් හි, අංක 15 සහ 15 A දරන අක්කර 02යි රූඩ් 02යි පර්චස් 35ක් වන ඉඩම සමඟ ඇති වර්ග මීටර් 1600ක් පමණ වන ගොඩනැගිල්ල නීති විරෝධී ආකාරයෙන් දේශපාලන හිතවත්කම් මත රු.25,000/-ක් වැනි සුළු මුදලකට බදු දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ඉඩම බදු දී ඇති ආයතනය කවරේද; ඒ සඳහා අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන්ද;

(ii) ඉහත (අ) හි සඳහන් දේපළ, කුලියට ලබා දීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iii) මාසික කුලිය තීරණය කරනු ලැබුවේ කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී මෙම ඉඩමෙන් පර්චස් 31ක කොටසක් රු.125,000/-ක මාසික කුලියකට ලබාදී තිබූ බව දන්නේද;

(ii) එසේ නම්, 2014 වර්ෂයේදී, රු.25,000/-ක මාසික කුලියකට පර්චස් 435ක් වූ මෙම ඉඩම බදු දීමෙන්, වරාය අධිකාරියට සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) මෙම මූල්‍ය වංචාව පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයේ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

256/'15

6.

ගරු බිමල් රත්නායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011, 2012, 2013, 2014 වර්ෂයන්හීදී,

(i) ළමා අපචාර පිළිබඳව පවරා ඇති නඩු සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ළමා අපචාර පිළිබඳ නඩුවලින් වරදකරුවන් බවට ඔප්පු වූ සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ළමා අපචාර පිළිබඳ නඩුවලින් වරදකරුවන් බවට ඔප්පු වූ සංඛ්‍යාව, එක් එක් වර්ෂයේ පැවරූ මුළු නඩු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

259/'15

7.

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනාධිපතිවරණයේදී ජනාධිපති ධුර අපේක්ෂක වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ඉදිරිපත් කල "මෛත්‍රී පාලනයක් සිය දිනකින් අලුත් රටක්" නම් වැඩසටහනේ අංක 26ට අනුව, උකස් කර ඇති රන් භාණ්ඩ සඳහා ගෙවිය යුතු අධික පොලිය හා දඩ මුදල් රුපියල් ලක්ෂ දෙකක උපරිම වටිනාකමකට යටත්ව කපා හරින බවට ලබා දුන් පොරොන්දුව අනුව පොලී හා දඩ කපා හැරීම නිසා බැංකු සඳහා නොලැබී ගිය පොලී හා දඩ මුදල් ආදායම, එක් එක් බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

271/'15

8.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිටපු විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ලෝක වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල අනුව දේශීය වෙළඳපොළේ මිල වෙනස් වන මිල සූත්‍රයක් හඳුන්වා දෙන බව 2015 ජනවාරි 16 දින ප්‍රකාශ කළ බව දන්නේද;

(ii) මෙතෙක් එවැනි මිල සූත්‍රයක් හඳුන්වා නොදීමට හේතු කවරේද;

(iii) එවැනි මිල සූත්‍රයක් හඳුන්වා දීමට ඉදිරියේදී පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

280/'15

9.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීතොටමුල්ල කුණු කන්ද ඉවත් කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) නාගරික සංවර්ධන අධිකාරිය මගින් ටෙන්ඩර් කැඳවන ලද, මීතොටමුල්ල කුණු කන්ද ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළ සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා ලබාදෙන රාජ්‍ය මැදිහත්වීම කවරේද;

(iv) මෙම ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළ ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළෙහි පළමු අදියර යටතේ කොළඹ නගරයේ කුණු ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන්නේද;

(ii) එසේ නම්, දෙවන අදියර ලෙස මීතොටමුල්ල කුණු කන්දේ ඇති කුණු ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන්නේද;

(iii) මෙම කුණු කන්ද නිසා පීඩාවට පත්ව සිටින කුණු කන්ද අවට ජීවත්වන සාමාන්‍ය ජනතාවට සාධාරණයක් ඉටු කිරීම සඳහා කොළඹ මහනගර සභාව සමඟ එක්ව වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

307/'15

10.

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැයකළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලබාගත් ආකාරය කවරේද;

(iii) එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මෙහි පවත්වා ඇති අන්තර්ජාතික එක්දින, ටෙස්ට් සහ විස්සයි විස්ස තරඟ සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිරි වර්ෂයේදී එම ක්‍රීඩාංගණයේ තරඟ පැවැත්වීමට සැලසුම්කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය විවාහ මංගල උත්සව සඳහා කුලියට දීමක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා දිනකට අය කරනු ලබන මුදල කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් කරුණ සම්බන්ධයෙන් ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

308/'15

11.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමාගම, දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදල, ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා යොදා ගනු ලැබුවේද;

(iii) එසේ නොමැති නම්, එම මුදල් වැය කරන ලද කාරණය කවරේද;

(iv) මෙම මුදලට අමතරව ක්‍රීඩාංගණය තැනීම සඳහා විදේශ ආධාර හෝ වෙනත් දේශීය අරමුදල් ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2011 ක්‍රිකට් ලෝක කුසලානය වෙනුවෙන් ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයෙන් ලැබුනු මුදල කොපමණද;

(ii) ඛෙත්තාරාම, පල්ලෙකැලේ සහ සූරියවැව ක්‍රීඩාංගණ නවීකරණය හෝ තැනීම වෙනුවෙන් වැය කරන ලද මුදල, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ක්‍රීඩාංගණ නවීකරණය හෝ තැනීම් කටයුතු සිදුකළ ආයතන, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) නවීකරණය හෝ තැනීම සඳහා ගෙවන ලද මුදල, එක් එක් ක්‍රීඩාංගණය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම නවීකරණ හෝ තැනීම් කටයුතු සිදුකළ ආයතනවලට ගෙවීමට ඇති හිඟ මුදල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

58/'15

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 සහ 2014 යන වර්ෂයන්හි උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන් සඳහා රජයේ වියදමින් සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, එම විදේශ සංචාර සඳහා සහභාගී වූ මන්ත්‍රීවරුන් ගණන හා ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාරයන් සඳහා පළාත් සභාව වියදම් කළ මුදල, එක් එක් මන්ත්‍රීවරයාට වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන්ට සහභාගී වූ හේතු කවරේද;

(ii) එම සංචාරයන්ගෙන් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මන්ත්‍රීවරුන්ට අමතරව පළාත් සභාවේ වියදමින් වෙනත් පුද්ගලයින් විදේශ සංචාරයන්ට සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම පුද්ගලයින් විදේශගත වීමට හේතු කවරේද;

(iv) එයින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— 2015.10.06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, පාර්ලිමේන්තුව රැස්වන අද දින, රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 2.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය පත්කිරීම සඳහා යෝජනා සම්මතය,— කල් තබන ලද ප්‍රශ්නය. (2016 ජනවාරි 09),— "ශ්‍රී ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගත යුතු යැයි ශ්‍රී ලාංකික ජනතාව අතර පුළුල් එකඟතාවයක් ඇති හෙයින් ද;

2015 ජනවාරි මස 08 වැනි දින පැවති ජනාධිපතිවරණයේදී නීතියේ ආධිපත්‍යයට ගරු කෙරෙන සහ ප්‍රජාතන්ත්‍රවාදය සවිමත් කෙරෙන දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීමෙහි ලා පැහැදිලි ජනවරමක් ජනතාව විසින් ලබාදී ඇති හෙයින් ද;

ඉහත කී ජනාධිපතිවරණයේදී ජනතාව ප්‍රකාශ කරන ලද අභිප්‍රාය බලගැන්වීමට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කෙරෙන්නා වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මතකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් සිය අභිලාෂය පැහැදිලිව ප්‍රකාශකර ඇති හෙයින් ද;

විධායක ජනාධිපති ධූරය අහෝසි කෙරෙන්නාවූ ද, මනාප ඡන්ද ක්‍රමය ඉවත් කර ජනතා නියෝජනය සාධාරණව පිළිබිඹු කරන්නා වූ මැතිවරණ ක්‍රමයක් සහතික කෙරෙන්නා වූ ද, සියලු පුරවැසියන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් ශක්තිමත් කරන්නාවූ ද, ජාතික ප්‍රශ්නයට ව්‍යවස්ථාමය විසඳුමක් සපයන්නාවූ ද, ජාතික ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කරන්නා වූ ද, නීතියේ ආධිපත්‍යයට ගරු කෙරෙන දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කරන්නා වූ ද, ජනතාවගේ මූලික අයිතීන් හා නිදහස මගින් මානව අභිමානය තහවුරු කරන්නාවූ ද වගකිව යුතු, වගවන්නාවූ ආණ්ඩු ක්‍රමයක් ප්‍රවර්ධනය කරන්නා වූ ද, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මතකර ගැනීමේ අවශ්‍යතාවය මතුවී ඇති හෙයින් ද;

1. ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම පිළිබඳව සලකා බලා ජනතාවගේ අදහස් හා උපදෙස් ලබාගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාව යටතේ ඒ වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් පාර්ලිමේන්තුව විසින් සලකා බලනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් සැකසීමේ කාර්ය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විතවන මෙහි මින් මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන පාර්ලිමේන්තු කාරක සභාවක් තිබිය යුතු යැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් තෝරා පත්කර ගත යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයන් හත් (7) දෙනෙකු සිටිය යුතු ය.

   ගරු කථානායකතුමා නොපැමිණි අවස්ථාවන්හිදී, මණ්ඩලයේ රැස්වීම්වල මූලසුන හොබවනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයන් අතුරින් අයෙකු තෝරා පත් කළ යුතු ය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය විස්සක් (20) ක් විය යුතු ය.

4. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උපදේශකවරුන්;

   (ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සඳහා නීති ලේකම්වරයෙකු හා එකී නීති ලේකම්වරයා සඳහා සහායකයින්;

   (ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා 5 වන වගන්තියේ යොමුගත කමිටුවල කටයුතු වාර්තාකරණය පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩලය; සහ

   (ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ (සමාජ මාධ්‍ය ඇතුළුව) මාධ්‍ය කාර්ය මණ්ඩලයක්;

   සිටිය යුතුය.

ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය ප්‍රචාරණය ලබාදීමෙහිලා මාධ්‍ය කාර්ය මණ්ඩලය විසින් වෙබ් අඩවියක් පිහිටුවා එය පවත්වාගෙන යා යුතු අතර වෙනත් සුදුසු මාධ්‍ය ද යොදා ගත යුතු ය.

අදාළ සෙසු ප්‍රවීණයන්ගේ හෝ විශේෂඥ මතද ඇතුළත්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා එහි කාරක සභාවන්හි කටයුතු මෙන්ම මහජන අදහස් / කරුණු ඉදිරිපත් කිරීම්ද, එම වෙබ් අඩවියෙහි ලේඛනගත කොට ප්‍රකාශයට පත්කරන බවට මාධ්‍ය කාර්ය මණ්ඩලය සහතික විය යුතු ය.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය පහත සඳහන් අනු කමිටුවලින් සමන්විත විය යුතු ය:—

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් පත් කරනු ලබන, අග්‍රාමාත්‍යවරයා (සභාපති), පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශවයේ නායකවරයා, අධිකරණ අමාත්‍යවරයා හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සෙසු සාමාජිකයින් දහහත් (17) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් යුත් මෙහෙයුම් කමිටුවක්;

මෙහෙයුම් කමිටුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු හා ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ කාර්යය සඳහා වගකිව යුතු ය.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් පත්කළ හැකි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත සෙසු අනු කමිටු;

එසේ වුවද, එක් එක් අනු කමිටුවක සාමාජික සංඛ්‍යාව එකොළහ (11) කට නොවැඩි විය යුතු ය.

එක් එක් අනු කමිටුවේ සභාපතිවරයා මෙහෙයුම් කමිටුව විසින් පත්කරනු ලැබිය යුතු ය.

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් එහි පළමු රැස්වීමේදී—

(අ) නියෝජ්‍ය සභාපතිවරයන් තෝරා පත්කර ගත යුතු ය;

(ආ) 5(ආ) වගන්තියේ යොමුගත අනු කමිටු තීරණය කළ යුතු ය; සහ

(ඇ) 5 වගන්තියේ යොමුගත අනු කමිටුවලට සාමාජිකයින් තෝරාපත් කර ගත යුතු ය.

7. අමාත්‍ය මණ්ඩලයට හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රථම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් සලකා බලනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් යෝජනා කරමින් යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස මෙහෙයුම් කමිටුවෙන් ඉල්ලා සිටිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් සම්මත කරනු පිණිස අග්‍රාමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ පළමුවැනි රැස්වීමේදී යෝජනාවක් ඉදිරිපත් කළ යුතු ය.

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත ස්වකීය රැස්වීම් පාර්ලිමේන්තුවේ සභා ගර්භයෙහි පැවැත්වීමට මෙයින් බලය පවරනු ලැබේ,

එසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට බස්නාහිර පළාතෙන් පිටත වූ වෙනයම් නිශ්චිත ස්ථානයකදී සිය රැස්වීම් පැවැත්වීමට තීරණය කළ හැකිය.

එසේම, තව දුරටත්, ලිපිලේඛන ඉදිරිපත් කිරීම, යෝජනා ඉදිරිපත් කිරීම හා යම් කරුණක් සම්බන්ධයෙන් ඡන්දය ලබාදීම පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ දී පමණක් සිදුවිය යුතුය.

9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හෝ එයට අයත් යම් කමිටුවක අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් කමිටුවට අවශ්‍ය සේවාවන් අවශ්‍ය වන්නා වූ ඕනෑම ආයතනයකින් ලබාගත යුතු ය.

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට හා /හෝ එහි විවිධ අනුකමිටුවලට සහයවනු පිණිස හා උපදෙස් ලබාදෙනු පිණිස සෙසු ප්‍රවීණයන් මෙහෙයුම් කමිටුව විසින් පත්කරනු ලැබිය හැකිය.

11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු මහජනතාවට විවෘත විය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා අනු කමිටුවල කටයුතු ලේඛනගත කොට වහා ප්‍රකාශයට පත් කළ යුතු ය. සුදුසු අවස්ථාවන්හි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා/හෝ එහි අනු කමිටුවල කටයුතු විකාශනය කිරීම සහතික කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

සැක ඇතිවීම වළක්වනු පිණිස, පෙර කී කරුණු ප්‍රකාශනය සඳහා පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාර, පාර්ලිමේන්තුවේ විශේෂ අවසරය නිශ්චිතව ලබා දෙනු ලබන බවට මෙහිලා නිශ්චිත වශයෙන්ම යෝජනා කෙරේ.

සැක ඇතිවීම වළක්වනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා පස්වන වගන්තියේ යොමුගත අනු කමිටුවල කටයුතු පාර්ලිමේන්තුව වෙත සමගාමීව වාර්තා කර ඇත්තා සේ හා මෙහිලා නිශ්චිත වශයෙන්ම බලය ලබාදෙනු ලබන යම් කටයුතු ප්‍රකාශයට පත් කිරීම් මඟින් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත ප්‍රකාර වරදක් සිදු නොවනු ඇති බව තවදුරටත් යොජනා කෙරේ.

12. උපදෙස් ලබාගැනීම සඳහා සහ/හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඕනෑම පුද්ගලයෙකු කැඳවීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට තිබිය යුතු ය.

13. මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ නිර්දේශ පිළිබඳ උපදෙස් ලබාගැනීම සහ / හෝ කරුණු ඉදිරිපත් කිරීම සහ / හෝ වාර්තා කිරීම සඳහා මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ ඕනෑම සාමාජිකයෙකු කැඳවීමේ බලය ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට තිබිය යුතු ය.

14. මෙහි දක්වා ඇති විධිවිධානවලට යටත්ව, ස්වකීය කටයුතු ඉටුකිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හා යාන්ත්‍රණයන් පිළිබඳ තීරණය කිරීමේ බලය ද මෙහිලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට පවරනු ලැබේ:

එසේ වුවද, එකී තීරණය මෙහෙයුම් කමිටුවේ එකඟත්වය ඇතිව අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මතයකට පසුව ගත යුතු ය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට පටහැනිව කුමක් සඳහන් වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සහ එහි අනුකමිටුවල කාර්ය පරිපාටික රීති මෙම යෝජනා සම්මතයේ දක්වා ඇති පරිදි විය යුතුය.

15. මෙහෙයුම් කමිටුව විසින් ලබා දෙනු ලබන අනුමතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු පිළිබඳ දැන්වීම අග්‍රාමාත්‍යවරයා හෝ අග්‍රාමාත්‍යවරයා විසින් ඒ සඳහා කලින් කලට නම් කරනු ලබන වෙනත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු විසින් කරනු ලැබිය යුතු ය.

16. 5(ආ) වගන්තියේ යොමුගත එක් එක් අනු කමිටුවක් පත්කිරීමෙන් සති දහයක් (10) ඇතුළත එම අනු කමිටු විසින් ස්වකීය වාර්තා මෙහෙයුම් කමිටුව වෙත භාර දෙනු ලැබිය යුතු ය.

17. 5(ආ) වගන්තිය යටතේ පත්කරන ලද අනු කමිටුවල සහ මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ වාර්තා සලකා බැලීමෙන් අනතුරුව මෙහෙයුම් කමිටුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. එකී වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් ද සමඟ ඉදිරිපත් කළයුතු ය.

18. ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් වාර්තාවේ හා (අදාළ වන්නේ නම්) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි පොදු යෝග්‍යතාවයන් හා මූලධර්ම විවාදයට ගනු ලැබ යෝජිත සංශෝධන ද විවාදයට ගනු ලැබිය යුතු ය. එවැනි විවාදයන් අවසානයේදී "අවසාන වාර්තාවක් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳ යෝජනා සම්මතයක් මෙහෙයුම් කමිටුව විසින් ඉදිරිපත් කළ යුතු ය." යනුවෙන් මූලාසනය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

19. ඉනික්බිතිව, මෙහෙයුම් කමිටුව විසින් විවාදය අතරතුර යෝජිත යම් සංශෝධනයන් වේ නම්, ඒවා ද සැලකිල්ලට ගනිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් සළකා බලනු පිණිස අවසාන වාර්තාවක් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් ද ඉදිරිපත් කළ යුතු ය. එකී වාර්තාව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් අනුමත කළයුතු බවට යෝජනා සම්මතයක් අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

20. 18 වන වගන්තියෙහි යොමුගත විවාද කාල සීමාව තුළ පහත සඳහන් ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය:—

සභාපතිවරයා හෝ සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, යම් නියෝජ්‍ය සභාපතිවරයෙකු විසින් එක් එක් වගන්තිය අංක පිළිවෙළින් කියවිය යුතු ය.

(i) යම් වගන්තියකට සංශෝධනයක් ගෙන ඒම, හෝ වගන්ති ඉවත් කිරීම හෝ නව වගන්ති ඇතුළත් කිරීම හෝ කළ හැකිය.

(ii) විවාදය මෙම අදියර තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි විස්තර විනා එහි මූලධර්මය සාකච්ඡාවට නොගත යුතු ය.

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි යම් පූර්ව කොටසක් මත එළැඹි යම් තීරණයක් හා අනනුකූල කිසිදු සංශෝධනයක් යෝජනා කළ නොහැකිය.

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත කියවා අවසන් කරන ලදුව, එකී කෙටුම්පත පිළිබඳ විවාදය අවසන් කිරීමට ප්‍රථම, යම් සාමාජිකයෙකුට, සභාපතිවරයාගේ අවසරය මත, ඒ වනවිට ද සම්මතකර ඇති යම් වගන්තියකට සංශෝධනයක් යෝජනා කළ හැකිය.

(v) යම් වගන්තියකට ගෙන එනු ලබන සංශෝධනයක් පිළිබඳ වූ ප්‍රශ්නයක් මුළුමනින්ම මූලාසනය විසින් ඉදිරිපත්කර ඇත්තේ නම් විනා වගන්තියක් කල් දැමිය හැක.

(vi) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි ඉතිරි වගන්ති සලකා බැලීමෙන් අනතුරුව හා නව වගන්ති ගෙන ඒමට ප්‍රථම කල්තැබූ වගන්ති සලකා බැලිය යුතු ය.

(vii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි උපලේඛන සලකා බැලීමට ප්‍රථම නව වගන්ති ඉදිරිපත් කළ හැකි අතර ඒවා පළමු වැනි වර කියවූවා සේ සැලකිය යුතුය. ඉනික්බිතිව, එළඹෙන ප්‍රශ්න "වගන්තිය දෙවනවර කියවිය යුතුය" හා "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට වගන්තිය (හෝ සංශෝධිත පරිදි වූ වගන්තිය) එකතු කළ යුතු ය" වේ.

(viii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි උපලේඛන ඉවත් කිරීමෙන් අනතුරුව නව උපලේඛන ඉදිරිපත් කළ හැකි අතර ඒවා නව වගන්ති ස්වභාවයෙන්ම සැලකිය යුතු ය.

(ix) සෑම වගන්තියක් හා උප ලේඛනයක්ම සහ යෝජිත නව වගන්තියක් හෝ උප ලේඛනයක් සම්බන්ධ කටයුතු කළ පසුව, යම් පූර්විකාවක් වන්නේ නම් එය සලකා බලා "මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි පූර්විකාව විය යුතුය" යන ප්‍රශ්නය ඉදිරිපත් කළ යුතු ය.

(x) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි නාමයට යම් සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම්, සවිස්තරව දක්වා ඇති ඉහත කී කාර්යාවලීන් අවසානයේදී එය සිදුකළ යුතු ය.

21. අවශ්‍ය වෙනස් කිරීම් සහිතව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 42, 43 හා 44 හි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතුවලට අදාළ විය යුතු ය.

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සභිකයන් අතරින් තුනෙන් දෙකක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත අනුමත නොකරන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සහ මෙකී යෝජනාවේ යොමුගත කමිටු විසුරුවා හැරියා සේ සැලකිය යුතු ය.

23. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් අනුමත කරන්නේ නම්, වාර්තාව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත මෙහෙයුම් කමිටුව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු අතර, ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සහ මෙකී යෝජනාවේ යොමුගත අනුකමිටු විසුරුවා හැරියා සේ සැලකිය යුතු ය.

24. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75(ආ) ව්‍යවස්ථාව හා 120(ආ) ව්‍යවස්ථාව ප්‍රකාර මුළුමනින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් වශයෙන් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව මඟින් විධිවිධාන සලසා තිබෙන පරිදි විශේෂ බහුතරයකින් සම්මත කරගනු ලැබ ජනමත විචාරණයක් මඟින් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරෙන පනත් කෙටුම්පතක් වශයෙන් එකී වාර්තාවේ අන්තර්ගත පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කළ යුතු ය.

25. ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(1) ව්‍යවස්ථාව ප්‍රකාර එකී පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

26. ඉන්අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, සෑම පළාත් සභාවකම අදහස් ප්‍රකාශ කිරීමට ජනාධිපතිවරයා විසින් එකී පනත් කෙටුම්පත එකී සෑම සභාවකටම යොමු කරනු ලැබිය යුතු ය.

27. ඉනික්බිතිව, අග්‍රාමාත්‍යවරයා විසින් එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

28. ඉහතින් සඳහන් කළ පරිදි, එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කරගත යුතු බවට අග්‍රාමාත්‍යවරයා එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

එකී පනත් කෙටුම්පතට පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවේ නම්, මෙකී පනත් කෙටුම්පත විශේෂ බහුතර ඡන්දයෙන් පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද බවත්, ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍ය පිහිටා ඇති ජනතාව විසින් ජනමත විචාරණයකදී අනුමත කරන තුරු පනත් කෙටුම්පත නීතියක් බවට පත් නොවන්නේ ය, යනුවෙන් කථානායකවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාර යෝග්‍ය සහතිකයක් ලබා දිය යුතුය.

29. ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ජනාධිපතිවරයා විසින් පනත් කෙටුම්පත ජනමත විචාරණයක් මඟින් ජනතාවගේ අනුමතිය පිණිස ඉදිරිපත් කළ යුතුය.

30. පනත් කෙටුම්පත ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කරනු ලැබ තිබේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් සහතික කිරීම මත පනත් කෙටුම්පත නීතියක් බවට පත්වන්නේය.

31. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ, 5 වගන්තියේ යොමුගත අනුකමිටුවල, සහ මෙකී යෝජනාව ප්‍රකාරව පත්කරන ලද කාර්ය මණ්ඩලයේ හා උපදේශකවරුන්ගේ වියදම් ඒකාබද්ධ අරමුදලින් දැරිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාව ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් යෝග්‍ය පියවර ගත යුතු ය.

32. සැකයක් ඇති නොවනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් යෝජිත ආකාරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සම්මත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සංශෝධනවලට යටත්ව සම්මත කිරීම පාර්ලිමේන්තුවේ වගකීම විය යුතු බවට මෙහිලා ප්‍රකාශ කෙරේ.

33. සැකයක් ඇති නොවනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුළුව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක විශේෂ බහුතර ඡන්දයකින් පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබ, ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාවේ ප්‍රකාරව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කරන්නේ නම් පමණක් නීතියක් වශයෙන් පැනවිය යුතු බවට මෙහිලා තවදුරටත් ප්‍රකාශ කෙරේ" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*2.

සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ක්ෂුද්‍රමූල්‍ය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතින් අවසන් වරට සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 12 දිනැති අංක 1949/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 1),— කලින් කලට සංශෝධන කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තියේ (1) උප වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 978, 979 සහ 980 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 2),— කලින් කලට සංශෝධන කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තියේ (1) උප වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 04 දිනැති අංක 1943/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 981 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 3),— කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ මත්පැන්වල සැර ප්‍රමාණය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 15 දිනැති අංක 1945/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 982 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 4),— කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 15 දිනැති අංක 1945/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 983 සහ 984 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 5),— (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතෙහි 4 සහ 13 වගන්ති යටතේ විදේශ මත්පැන් අලෙවිය හා ප්‍රවාහනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 31 දිනැති අංක 1947/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 985 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 6),— (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ හෝටල් තුළ මධ්‍යසාර භාවිතයට අදාළ ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 31 දිනැති අංක 1947/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 986 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 7),— කලින් කලට සංශෝධන කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තියේ (1) උප වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 31 දිනැති අංක 1947/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 987 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වගන්තිය සමඟ කියවිය යුතු 26 වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 14 දිනැති අංක 1945/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 01 දිනැති අංක 1947/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 3),—1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 දෙසැම්බර් 11 දිනැති අංක 1944/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.02.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*